# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2274/07 – 2022 අප්‍රේල් 04 වැනි සඳුදා – 2022.04.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2019/339.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශවයක් වශයෙන්,*

ඩබ්. ජී. අයි. එම්. අමරසිංහ මයා, අංක 60/3, මැදවෙල, හාරිස්පත්තුව.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

මෙට්රෝ ඔටෝ මාර්ට් (පුද්ගලික) සමාගම, අංක. 481, දෙවන මහල, ගාලුපාර, රාවතාවත්ත, මොරටුව.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මිනුවන්ගොඩ, ධර්මරාජ මාවත, අංක 11/ඒ, නීතිඥ එල්. ඒ. ප්‍රියන්ති ලියනආරච්චි මිය පත්කර ඇය වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2022 මාර්තු මස 29 වැනි දින,
කොළඹ දී ය.


1A – G 36544 – 10 (2022/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/03/2019/339.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

ඩබ්. ජී. අයි. එම්. අමරසිංහ මයා, අංක 60/3, මැදවෙල, හාරිස්පත්තුව.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

මෙට්රෝ ඔටෝ මාර්ට් (පුද්ගලික) සමාගම, අංක. 481, දෙවන මහල, ගාලුපාර, රාවතාවත්ත, මොරටුව.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

''මෙට්රෝ ඔටෝ මාර්ට් (පුද්ගලික) සමාගමේ අලෙවි නියෝජිතයෙකු වශයෙන් සේවය කරන ලද ඩබ්. ජී. අයි. එම්. අමරසිංහ මහතාට,

- 2017 ජනවාරි සිට 2018 පෙබරවාරි දක්වා කාලයට කොමිස් මුදල් හා දුරකථන ගාස්තු
- 2017 අගෝස්තු හා 2017 සැප්තැම්බර් මාස 2 සඳහා වාහන දීමනා
- සේවා කාලය තුළ ආයතනය විසින් කොමිස් මුදලින් අඩු කරන ලද 1% කොමිස් මුදල හිමි ද? යන්නත්, හිමි නම්, එම දීමනා නොගෙවීමෙන් පැමිණිලිකරුට අසාධාරණයක් සිදු වී තිබේ ද? ඒ සම්බන්ධයෙන් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේ ද? යන්න පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 මාර්තු මස 28 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 04 - 0015